# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග **2024.03.25** දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය)

1. **භාෂා පරිවර්තක (පුරප්පාඩු මුළු තනතුරු සංඛ්‍යාව 13)**
(සිංහල/ දෙමළ/ සිංහල)/(සිංහල/ ඉංග්‍රීසි/ සිංහල)/(ඉංග්‍රීසි/දෙමළ/ඉංග්‍රීසි)

1.1 *වැටුප් පරිමාණය*- 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.32,330-3x380/10x445/4x660- රු. 40,560/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 74,000/- පමණ වේ).

1.2 *වයස් සීමාව*- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සහ පාර්ලිමේන්තු සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

1.3 *අධ්‍යාපන සුදුසුකම්*-
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් 04කින් සමත් වී තිබීම/ (නව නිර්දේශය) එකවර විෂයයන් 03කින් සමත් වී තිබීම ;

සහ

(i) භාෂා පරිවර්තක ( සිංහල/ දෙමළ/ සිංහල) (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 04)
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල, දෙමළ සහ ගණිතය ඇතුළුව විෂයයන් 5කට සම්මාන සහිතව විෂයයන් 6කින් සමත් ව තිබීම;

(ii) භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි/ සිංහල) (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 06)
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව විෂයයන් 5කට සම්මාන සහිතව විෂයයන් 6කින් සමත් ව තිබීම;

(iii) භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ/ඉංග්‍රීසි) (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 03)
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව විෂයයන් 5කට සම්මාන සහිතව විෂයයන් 6කින් සමත් ව තිබීම.

1.4 වෘත්තීය සුදුසුකම්:-
පරිගණක සාක්ෂරතාවය පිළිබඳව පිළිගත් ආයතනයකින් සහතිකයක් ලබා තිබීම.

1.5 පළපුරුද්ද:-
ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව රජයේ හෝ පිළිගත් ආයතනයක භාෂා පරිවර්තක තනතුරක වසර 5කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

1.6 බඳවා ගැනීමේ ක්‍රමය:- ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

2. **ගෘහ පාලන සහායක තනතුර (පුරප්පාඩු මුළු තනතුරු සංඛ්‍යාව 14)**

2.1 වැටුප් පරිමාණය:- 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9x270/10x 300/6x330-රු. 32,930/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 63,000 පමණ වේ).

2.2 වයස්සීමාව :- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

2.3 අධ්‍යාපන සුදුසුකම්:- සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක්ද ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

2.4 වෘත්තීය සුදුසුකම්:- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක,හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ මාස 05කට නොඅඩු පාඨමාලාවක සහතිකයක් ලබා තිබීම;

හෝ

හෝටල් ගෘහපාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ NVQ Level II සහතිකයක් ලබා තිබීම.

2.5 පළපුරුද්ද:- ඉහත (2.3) සහ (2.4) හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තරු පංතියේ හෝටලයක හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

2.6 බඳවාගැනීමේ ක්‍රමය :- ලිඛිත/ වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. සේවා නියමයන් හා කොන්දේසි:-

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එසේ වුවද, මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළවන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

4. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය:-

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික;

5. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

6. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

7. අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

8. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන(දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරනු ලබන්නේ නම්) ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

චමින්ද කුලරත්න,
වැ.බ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2024 මාර්තු මස 05 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.